# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1823/22 - 2013 අගෝස්තු මස 13 වැනි අඟහරුවාදා - 2013.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 11/2009.

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

27අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මේ නියමය මගින් -

(අ) 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත මගින් පිහිටු වන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු කර ඇත්තාවූ ද, මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති *යටවැහැර නොහොත් යටවෙහෙර* යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඉඩම හා සම්බන්ධ 1985 අප්‍රේල් මස 09 වැනි දින අංක 344/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, එකී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පවරා දෙන ලද යටවැහැර නොහොත් යටවෙහෙර යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන්නා වූ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යටවැහැර නොහොත් යටවෙහෙර නමැති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ නියමයේ කොටස, එකී මණ්ඩලය වෙත සතු කිරීම සඳහා වූ ප්‍රතිඡ්ඨාවට අදාළ නියම හෝ කොන්දේසි අනුව ක්‍රියා කර නොමැති වීම හේතුවෙන් එකී නියමන් ප්‍රත්‍යාදිෂ්ට කිරීම මගින් එම නියමය මෙයින් සංශෝධනය කරමි.

(ආ) මෙම ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් පසුව, මෙහි දෙවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇති එකී ඉඩමේ බිම් ප්‍රමාණය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත සතු කර දෙන බවට මෙයින් ප්‍රකාශ කරමි.

**පළමුවන උපලේඛනය**

***ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ඇති යටවැහැර නොහොත් යටවෙහෙර නම් ඉඩමේ විස්තර***

| ගැසට් නිවේදනය පිළිබඳ විස්තර | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් |
|---|---|---|---|---|
| 1985.04.09 දින අංක 344/5 | යටවෙහෙර | කුරුණෑගල | කුරුණෑගල | 78.65 |

**දෙවන උපලේඛනය**

***කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තර***

| වෙන් කර දී ඇති විශේෂ අංකය | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පළමුවන උපලේඛනයේ සඳහන් සම්පූර්ණ ඉඩමෙන් කොමිෂන් සභාව වෙත පැවරෙන ඉඩම් කොටස |
|---|---|---|---|---|
| කො/1374 | යටවෙහෙර | කුරුණෑගල | කුරුණෑගල | වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටවැහැර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඇම්. එස්. හේරත් මහතා විසින් 2003.03.30 වැනි දින මැන සකස් කර ඇති අංක 4535ඒ දරන පිඹුරේ (මෙම ඉඩම සඳහා එච්. ඇම්. එස්. හේරත් මහතා විසින් 1997.01.21 දින මැන සකස් කරන ලද අංක 4535 දරන පිඹුරේ නැවත මැනීමකි) කැබලි අංක 01, 02 හා 03න් පෙන්නුම් කර ඇති,<br>උතුරට : බූ ඇල සහ ඉලංකෝන්ට අයත් ඉඩම ;<br>නැගෙනහිරට : බූ ඇල සහ ඉලංකෝන්ට අයත් ඉඩම ;<br>දකුණට : යටවැහැරවත්ත 5 වැනි කොටස ; සහ<br>බස්නාහිරට : මගුරු ඔය යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් අටයි දශම හයයි තුනයි දෙකයි පහක් වන (8.6325) බිම් ප්‍රමාණය වේ. |

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2013 ක් වූ අගෝස්තු මස 12 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

08 - 925

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.